ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 2011 අංක 2 දරන පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 ජනවාරි මස 28 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2011 ජනවාරි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක්
වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2011 අංක 2 දරන පීඩාකාරී ආයුධ (සංශෝධන)

[සහතිකය සටහන් කළේ 2011 ජනවාරි මස 28 වැනි දින]

එල්.ඩී.—ඕ. 24/2010.

1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2011 අංක 2 දරන පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනතේ 10 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලැබේ :— 1966 අංක 18 දරන පනතේ 10 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"පළාත්බද මහාධිකරණයේ නියෝගය මත හැර මේ පනත යටතේ වූ වරදවල් සඳහා ඇප ලබා නොදිය යුතු බව.

10. (1) යම් පළාතක් සඳහා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ පළාත්බද මහාධිකරණයක් විසින් නිකුත් කළ නියෝගයක් මත හැර, මේ පනත යටතේ යම් වරදකට චෝදනා කරනු ලැබ ඇති හෝ නඩු පවරනු ලැබ ඇති තැනැත්තකු, ඇප මත මුදා හරිනු නොලැබිය යුතු ය.".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

154860

PL 005311—3,340(2010/11)

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය